# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1774/8 - 2012 සැප්තැම්බර් මස 05 වැනි බදාදා - 2012.09.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 21/78 VIII.

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

20 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තියේ (අ) ඡේදය යටතේ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ මා විසින් සාදනු ලැබ 2012, අගෝස්තු මස 21 වැනි දින අංක 1772/5 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමයේ උපලේඛනයේ නිශ්චිතව සඳහන්වන උසස් අධ්‍යාපන ආයතනවල සහ ඒවාට අනුයුක්ත කොට ඇති උසස් අධ්‍යාපනය සඳහා වූ ආයතනවල වැඩ කටයුතු සහ පරිපාලනය යථා තත්වයට පත්ව ඇති බවට සෑහීමට පත්වීමෙන් පසු උසස් අධ්‍යාපන අමාත්‍ය දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක වන මම එකී විශ්වවිද්‍යාල පනතේ 20 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තියේ (අ) ඡේදය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී නියමය 2012 සැප්තැම්බර් මස 06 වැනි දින සිට බලපවත්වන පරිදි මේ නියමය මගින් පරිච්ඡින්න කරමි.

දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක,
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2012 සැප්තැම්බර් මස 04 වැනි දින,
කොළඹ දී ය.

09-534


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

1A - G 16547— 830 (2012/9)